# ඉන්දියාව හා එහි භූමිකාව

ඉන්දියාව යනු ලංකාව මෙන් නොව බ්‍රිතාන්‍ය විසින් නිර්මාණය කරන ලද රටකි. බ්‍රිතාන්‍යයන් එමට පෙර භාරතයේ ද එයටත් පළමුව දඹදිව ද තිබුණේ වාංශික රාජ්‍ය ය. මුස්ලිම් ආක්‍රමණයෙන් පසුව පිහිටුවන ලද රාජ්‍ය ද පසුව ඇතිවූ මහාරාජාවරුන් විසින් පිහිටුවන රාජ්‍ය ද වාංශික රාජ්‍ය ලෙස හැඳින්වීමට බාධාවක් නැත. වාංශික රාජ්‍යයක රජු හා වැසියන් එකම ජනවර්ගයකට අයත්වීම අනිවාර්ය නො වේ. එවැනි රාජ්‍යයක රජුට තමන් පාලනය කරන ජනවර්ගයෙහි හෝ යම්කිසි ජනකායක හෝ වැසියන්ගේ හෝ යම් අනන්‍යතාවක් සමග එකට එක අනුරූපිතයක් බොහෝ විට නැත. බ්‍රිතාන්‍යයන් පැමිණීමට පෙර භාරතය යනු රාජ්‍ය රාශියක් මිස රාජ්‍ය රාශියක එකතුවක්වත් නො වෙයි. බ්‍රිතාන්‍යයෝ මේ රාජ්‍ය එකතුකර ඒකීය රාජ්‍යයක් පිහිටුවූහ. විධායකය, ව්‍යවස්ථාදායකය, පරිපාලනය, අධිකරණය ආදිය එකම මධ්‍යස්ථානයකින් මෙහෙයවනු ලැබිණි. ඒ එක්සත් රාජ්‍යයක් හෝ සන්ධීය රාජ්‍යයක් හෝ නොවිණි. බ්‍රිතාන්‍යයන් පැමිණීමට පෙර තිබූ රාජ්‍ය එකතු වී සන්ධීය රාජ්‍යයක් පිහිටුවාගැනීමක් එහි දී නො සිදුවිණි. ඒකීය රාජ්‍යය පිහිටුවනු ලැබුයේ යටත්විජිතවාදයෙහි ප්‍රතිඵලයක් ලෙසිනි.

ඉන්දියානුවන් අද ලංකාව ගැන සිතන්නේ ද එලෙසිනි. ඒ ඔවුන්ගේ අත්දැකීම ය. තම අත්දැකීම ඔස්සේ අප දෙස ද බලන්නේ ඉන්දියානුවන් පමණක් නො වේ. බ්‍රිතාන්‍යයෝ ද, මෙරට සිටින රාජ්‍ය නොවන සංවිධානවල ඊනියා ඉතිහාසඥයෝ ද කොළඹ හා පේරාදෙණිය විශ්වවිද්‍යාලවල ඇතැම් ඉතිහාසඥයෝ ද සමාජයීය විද්‍යාඥයෝ ද, අප රට බ්‍රිතාන්‍යයන් විසින් පිහිටුවන ලද ඒකීය රාජ්‍යයක් ලෙස හඳුනති. ඔවුහු එක්සේසත් රාජ්‍යයක් ගැන මෙලෝ හසරක් නො දනිති. එක්සේසත් යනු කිසිවිටෙකවත් එක්සත් ලෙස නොකියැවුණ ද ජාතික ව්‍යාපාරයෙහි සිටින එකකු දෙදෙනකු ජනතාව එසේ සිතතියි යනුවෙන් උපකල්පනය කර විවිධ කර්තව්‍යවල යෙදෙන්නේ ජාතික ව්‍යාපාරයට ද හානි පමුණුවමිණි. ලංකාව එක්සේසත් රාජ්‍යයක් ලෙස පඬුඅබා රජු දවස සිට විකාශය වී ඇත. අප කලින් ද සඳහන් කර ඇති පරිදි එහි ප්‍රධාන ලක්ෂණ වූයේ අද භාෂාවෙන් කියන්නේ නම් එක් මධ්‍යස්ථානයකින් විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ බලතල මෙහෙයවීම, රාජ්‍ය විවිධ රටවලට (රජරට, රුහුණු රට, මායා රට ආදී) බෙදා, (අවශ්‍ය පරිදි ඒ රටවල් අටදහස් රට ආදී වශයෙන් තවත් රටවල්වලට ද බෙදා) ඒ රටවල් රජු වෙනුවෙන් රට කරවූ යුව රජ, ඈපා, මාපා ආදීන්ගේ පාලනයට නතුකර රට කිරීම, අවශ්‍ය විටක ඒ ප්‍රාදේශීය පාලයකන් ආපසු කැඳවීමට රජුට හැකිවීම, ජනතාවට හැකිතාක් ස්වයං පරිපාලනය (පාලනය නොව) ලබාදීම හා ඒ පරිපාලනය තොවිල් පහ වැනි විවිධ සභාමගින් කරගෙන යෑම වෙයි. අවස්ථා කිහිපයක දී ප්‍රාදේශීය පාලකයන් බලවත් වී රජුට විරුද්ධව කටයුතු කර ඇත. එවිට රජු ඒ ප්‍රාදේශීය පාලකයන් මැඩපවත්වා රට නැවත එක්සේසත් කර ඇති බව පැහැදිලි ය.

ඉන්දියාවට හෝ බටහිරට හෝ එක්සේසත් රාජ්‍යය පිළිබඳ අත්දැකීම් නැත. මෙරට බොහෝ පඬුවන්ට ද නැත. ඒ සියලු දෙනා ම බටහිර ආකෘති ඔස්සේ එක්සේසත් රාජ්‍යය දැකීමට උත්සාහ කරති. එමෙන් ම මේ අයට ජාතිය පිළිබඳව ද ඇත්තේ බටහිර ජාතික රාජ්‍යය පිළිබඳ අදහස ය. ඒ අනුව ජාතික රාජ්‍යවල ජාති පැන නගී. බටහිර ජාතික රාජ්‍ය බිහිවූයේ ධනපති ක්‍රමය ඇතිවීමෙන් පසුව බැවින් ජාතින් ඇතිවීමට පළමුවෙන් ධනපති ක්‍රමය වර්ධනය විය යුතු යැයි මොවුහු සිතති. ලංකාවේ ධනපති ක්‍රමය වර්ධනය වී නොමැති බැවින් මෙරට තවමත් ජාතියක් ඇති වී නැතැයි සිතන පඬියෝ ද වෙති! මොන විප්ලවයක්, අධිරාජ්‍ය විරෝධයක් ගැන නන්දෙඩෙව්වත් මොවුන්ගේ අධිරාජ්‍ය ගැති බටහිර මනස ඔද්දල් වී ඇත. මෙරට ජාතිය ගොඩනැගීම ගැන කතාකරන මොවුන්ට පඬුඅබා කල මෙහි ජාතියක් ගොඩනගා ඇති බව නො තේරෙයි. පඬිඅබා කල ධනපති ක්‍රමය තිබිණි දැයි ඔවුන් ප්‍රශ්න කරනු ඇත්තේ ජාතිය ගැන ඔවුන් දන්නේ බටහිරයන් කියා දෙන සොච්චම පමණක් බැවිනි.

බ්‍රිතාන්‍යයෝ ඉන්දියාවේ ජාතික රාජ්‍යයක් පිහිටුවූහ. ඒ ඉතා දැඩි මධ්‍යගත ඒකීය රාජ්‍යයකි. ඔවුන් එලෙස කෙළේ ඉන්දියාව නම් යටත්විජිතය පාලනයකිරීමේ පහසුව තකා ය. බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ ඒකීය රාජ්‍යය පිහිටුවීමට පෙර එහි තිබුණේ වාංශික රාජ්‍ය යැයි අපි කීවෙමු. එපමණක් නොව ඉන්දියාවේ ජනවර්ගවත් නොතිබිණි. එහි විවිධ භාෂා කතාකරන ජනයා සිටි බව ඇත්ත ය. එහෙත් ඒ භාෂා කතාකිරීම ඔස්සේ අඩුම තරමින් ජනවර්ගයක් ය යන අදහසවත් එහි බිහි වී නො තිබිණි. උදාහරණයක් ලෙස දෙමළ කතාකළ ජනයා ගනිමු. ඔවුහු විවිධ වාංශික රාජ්‍යවල ජීවත්වූහ. මුල් කාලයෙහි දී පාණ්ඩ්‍ය රජවරු ද්‍රවිඩ නො වූහ. එපමණක් නොව එහි ජනයා ද ද්‍රවිඩ භාෂාවක් කතාකළ බවට සාක්ෂි නැත. විජය රජුට පාණ්ඩ්‍ය දේශයෙන් ගෙනා මනාලිය දෙමළ හෝ වෙනත් ද්‍රවිඩ භාෂාවක් හෝ කතාකළ

© Prof. Nalin De Silva

කුමරියක් නොවන්නේ එබැවිනි. භාරතයට ම ද්‍රවිඩ භාෂා කතාකරන්නවුන් පැමිණ ඇත්තේ ක්‍රිස්තු පූර්ව හයවැනි සියවසේ පමණ නම් මුල් පාණ්ඩ්‍යයන් ද්‍රවිඩ භාෂාවක් කතාකිරීමට කිසිම ඉඩක් නැත. පසුකාලීන ව තෙළිඟු දේශයෙන් (ආන්ද්‍ර ප්‍රදේශයෙන්) රජවරු මදුරෙයි ආදී නගරවලට පැමිණ ඇත. ඔවුහු දෙමළ නොව තෙළිඟු බස කතාකළහ. මදුරෙයි නගරය ආශ්‍රිත ප්‍රදේශයෙහි කතාකරන දෙමළ බසෙහි තෙළිඟු වචන රාශියක් ඇත්තේ එබැවිනි. මෙරටට පැමිණි නායක්කාර වාංශිකයෝ ද එසේ පළමුව තෙළිඟු දේශයෙන් මදුරෙයි නගරයට පළා ආවෝ වෙති. ඔවුහු ද තෙළිඟු කතාකළහ. මදුරෙයි නගරයෙන් පැමිණිය ද ඔවුන් කතාකළ බස සිංහලයන් විසින් හඳුන්වනු ලැබුයේ අණ්ඩර දෙමළ යනුවෙනි. ඒ ඔවුන්ගේ මුල්බිම වූ ආන්ද්‍ර (අණ්ඩර) ප්‍රදේශය ගැන එකල සිටි සිංහල උගතුන් දැන සිටි බැවිනි. පරිහානියට පත් වී තිබිණි යැයි කියන නුවර යුගයේ උගතුන් ට වුව ද බටහිරයන්ගේ පූර්ණ ග්‍රහණුට පත් වී ඇති වර්තමාන සිංහල උගතුන්ට වඩා විචාර බුද්ධියක් තිබී ඇති බව පැහැදිලි ය. ඒ කෙසේ වෙතත් ඉහත සඳහන් තත්වයක් යටතේ භාරතයේ දෙමළ ජනවර්ගයක් පිළිබඳ පෞද්ගලික හා සාමූහික විඥානයක් ඒ ඒ වාංශික රාජ්‍යවල වාසය කළ දෙමළ කතාකරන ජනයාට ඇති නොවිණි. ඉන්දියාවේ ඇතැම් භාෂා කතාකරන ජනයාට ජනවර්ගයක් යන විඥානය ලබා දී ඇත්තේ බ්‍රිතාන්‍යයන් බව පැහැදිලි ය. බ්‍රිතාන්‍යයන් විසින් ඇතිකරන ලද ප්‍රධාන ජනවර්ගයක් වූයේ දෙමළ ජනවර්ගය ය. ඉන්දියාවට නිදහස ලබාගැනීම සාකච්ඡා කෙරුණු මුල් අවධියෙහි ම තමන්ට වෙන ම රාජ්‍යයක් අවශ්‍ය බව පළමුවෙන් ම සඳහන් කළෝ දෙමළ ජනවාර්ගිකයෝ ය.

ඉන්දියාව නිදහස ලැබීමෙන් පසුව ජවහර්ලාල් නේරු මහතාගේ ආණ්ඩුව ඉන්දියාව ජනවර්ග පදනමක් මත නොව කතාකරන භාෂාව මත පදනම් ව ප්‍රාන්තවලට බෙදා සන්ධීය රාජ්‍යයක් පිහිටුවී ය. එහි දී ද ජනවර්ග පදනමක් නොවූ බව අවධාරණය කළ යුත්තේ දෙමළ, බංගලි (වංග) වැනි ජනවර්ග හැරුණු විට බොහෝ ජන කණ්ඩායම් ජනවාර්ගික විඥානයක් අත්කරගෙන නොතිබූ බැවිනි. ඉන්දියාවට ඒ විසඳුම ගැලපෙනවා විය හැකි ය. ඒ ගැන අපට යමක් කීමට අනවශ්‍ය වන්නේ ඉන්දියාවේ කටයුතුවලට ඇඟිලිගැසීමට අපට අනවශ්‍ය බැවිනි. තමන්ගෙ මට්ටම් තම්මට්ටම් යනුවෙන් කියමනක් සිංහලයෙහි ඇත. එවැන්නක් ඉන්දියාවේ ඇත්දැයි අපි නො දනිමු. එහෙත් ඉන්දියාව නිරන්තරයෙන් ම අපේ කටයුතුවලට ඇඟිලි ගසයි. අපට බලපෑම් කරයි. මේ කිසිසේත්ම හිතකර තත්වයක් නො වේ. අපේ ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයකට ඉන්දියාවේ විසඳුම ලබාදීමට ඉන්දීය නායකයෝ කාලයක සිට ම උත්සාහ දරති. මෙරට ඉන්දියාවේ මෙන් ජනවාර්ගික ප්‍රශ්නයක් නොමැති බවත් ලංකාව යනු බ්‍රිතාන්‍යයන්ගේ නිර්මාණයක් නොවන බවත් මෙරට ඊනියා දෙමළ කතාකරන ජනතාවගෙන් යම් ප්‍රමාණයක් දෙමළ යන ජනවර්ගයට අයත් බවත්, ඉතිරි අය මුස්ලිම් ජනවර්ගයට අයත් බවත්, දෙමළ ජනවාර්ගික විඥානය නම් බ්‍රිතාන්‍යයන් විසින් ඇතිකරන ලද බවත්, එසේ වුවත් මෙරට මුස්ලිම් ජනවාර්ගික විඥානය ඉතා මෑත දී වෙනත් පදනමක බිහි වූවක් බවත්, මුස්ලිම් ජනවර්ගයට අයත් වුවන් අතර සිංහල කතාකරන පිරිස් ද ඇති බවත්, මෙරට ඇත්තේ සිංහල බෞද්ධ සංස්කෘතිය මෙරට විශේෂිත සංස්කෘතිය බව පිළිගනිමින් සිංහල ජාතිය පළල් කර එයට අනෙක් ජනවර්ග ඔවුන්ගේ අනන්‍යතා නැතිනොකර එකතුකරගන්නේ කෙසේද යන ප්‍රශ්නය බවත් ඉන්දියාවට දැන්විය යුතු ය. එහෙත් ඉන්දියාව අද ඉතාම ජඩ ආකාරයකින් ක්‍රියාකරන බව පැහැදිලි ය. ඉන්දියාව අපට ආදරයෙන් ක්‍රියාකරන ඉදිහිට අපට ටොක්කක් ඇන හොඳ නරක කියාදෙන අපේ වැඩිමහල් සොහොයුරා නො වේ. අප රට තම දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ආධිපත්‍යය යටතට ගැනීමට බලා සිටින ඊනියා කලාපීය බලවතා ය. හින්දු ඉන්දියාව අප බුදුදහම රැකගැනීම පිළිබඳ ව කිසි දිනෙක අපට සමාවක් නොදෙනු ඇත. භාරතයේ හෝ දඹදිව හෝ ඉතිහාසයේ ම අප රටට කරුණාවෙන් යහපතක් කර ඇත්තේ කිහිප දෙනකු පමණ ය. අනෙක් අය අප යටත්කරගැනීමට ඒ ඒ අවස්ථාවල ක්‍රියාකර ඇත. එවැනි අවස්ථාවල ඇතැම් විටෙක සිංහල රජවරු උපක්‍රමශීලීව එක් වාංශික රාජ්‍යයකට එරෙහිව තවත් වාංශික රාජ්‍යයක ආධාරය ලබාගෙන ඇත. එවැනි උපක්‍රම සෑම විටක ම සාර්ථක වී යැයි මෙයින් අදහස් නො කෙරෙයි. එහෙත් අද ඉන්දියාවේ එවැනි වාංශික රාජ්‍ය නොමැත. අද ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දියුණුවීමට දඟලන තනි ඉන්දියාවකි. ඉන්දියාව හා බටහිර රටවල් අතර අද එදා මෙන් දැඩි විරුද්ධතාව නැත. එමෙන් ම ඉන්දියන් සාගරය යනු ඉන්දියාවේ සාගරය යන පනික්කාර් කියමන අදටත් අදාළ ය. ඕනෑම රටක විදේශීය ප්‍රතිපත්තිය සකස්වන්නේ රටේ සුබසිද්ධියට අදාළ ව ය. ඉන්දියාව බලය විමධ්‍යගත කරන ලෙස ඉල්ලන්නේ පළමු පියවරේ දී මෙරට රාජ්‍යය දුර්වල කර උතුරේ හා නැගෙනහිර තමන්ට බය පක්ෂපාත ආණ්ඩු ඇතිකරගැනීමට ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva